**ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය - 2013**

**-----------------------------------------------**

ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධන) පනතේ 9 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරන කමිටුවේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණ කමිටුවේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

**-----------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හා ආදායම් හා වියදම් ප්‍රකාශනයේ වාර්තා ගත වු හෝ වාර්තාගත නොවු හෝ විෂයයන් සහ මූලිකාංග වලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුනේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

## 2.1 මතය ව්‍යාවනය

**-------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**---------------------------------------------**

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

**-------------------------**

සංගමය විසින් ලෙජර ගිණුම් විධිමත් ලෙස පිළියෙල කර පවත්වාගෙන ගොස් නොතිබු බැවින් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ඇති ගිණුම් ශේෂවල නිරවද්‍යතාවය තහවුරු කර ගත නොහැකි විය.

## 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගණුදෙණු හා ගිණුම් ශේෂයන්ට අදාලව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| විස්තරය | වටිනාකම් | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ගෙවිය යුතු නොපියවූ ආරම්භක ශේෂය 2011 | 409,039 | තහවුරු ලේඛන |
| ගෙවිය යුතු නොපියවූ ආරම්භක ශේෂය 2012 | 470,039 | |
| ස්ථාවර වත්කම් | 187,804 | වවුචර්, අදාල ලිපි ගොනු, ස්ථාවර වත්කම් ලේඛන |
| සුළු මුදල් ශේෂය | 99,528 | සුළු මුදල් පොත |
| ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලැබී තිබූ පුහුණුකරු දීමනා | 445,275 | ලදුපත් |
| ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබීම් | 3,056,982 | ලදුපත් හා බැංකු ප්‍රකාශන |